සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2016 ජූලි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2016-07-16
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අවස්ථා අපරාධ අධිකරණ බලය (prime instance criminal jurisdiction) ඇත්තේ කුමන අධිකරණයට ද?

(1) මහේස්ත්‍රාත් අධිකරණය.
(2) දිසා අධිකරණය.
(3) අභියාචනාධිකරණය.
(4) ශ්‍රේෂ්ඨාධිකරණය.

1.2 ශ්‍රී ලංකාවේ උත්තරීතර නීති මූලාශ්‍රය (most supreme source of law) ලෙස සලකනු ලබන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය.
(2) වාණිජ මහාධිකරණය (Commercial High Court).
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (The Constitution).
(4) නඩු තීන්දු (Case Law).

1.3 ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් ඒවා අතුරෙන් කුමක් ද?

(1) ශ්‍රී ලාංකීය නීති පද්ධතියේ පොදු / ශේෂ්‍ය නීතියක් (residual-law) නොමැත.

(2) සමථ මණ්ඩල (Mediation) යනු, විනිශ්චය නොවන (non-judicial) ආරවුල් විසඳීමේ ක්‍රමයකි (dispute resolution method).

(3) අභියාචනාධිකරණය යනු, අභියාචන අධිකරණ බලයෙහි ඉහළම අධිකරණයයි.

(4) ඉහත සඳහන් සියල්ලම.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන් පිටසන් වර්ගයක් (type of endorsement) **නොවන්නේ** කුමක් ද?

(1) හිස් පිටසන (blank endorsement).

(2) විශේෂ පිටසන (special endorsement).

(3) කොන්දේසි විරහිත පිටසන (unconditional endorsement).

(4) සීමාසහිත පිටසන (restrictive endorsement).

1.5 අතීතානුයෝගීව (retrospectively) ඇතිවන නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් (agency relationship) හඳුන්වනු ලබන්නේ:

(1) ප්‍රතිබන්ධනය (estoppel) මත නියෝජ්‍යත්වය ලෙසයි.

(2) අපරානුමතිය (ratification) මත නියෝජ්‍යත්වය ලෙසයි.

(3) අවශ්‍යතාවය (necessity) මත නියෝජ්‍යත්වය ලෙසයි.

(4) ප්‍රකාශිත (expression) නියෝජ්‍යත්වය ලෙසයි.

1.6 පහත සඳහන් සේවකයින් වර්ග අතුරෙන් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතෙන් [Employees' Provident Fund (EPF)] ආවරණය වන්නේ කුමන වර්ගය ද?

(1) කොන්ත්‍රාත් පදනම මත සේවකයින් (contract employees).

(2) ස්ථිර සහ ස්ථිර නොවන සේවකයින්.

(3) දෛනික වේතන උපයන්නන්.

(4) ඉහත සඳහන් සියල්ලම.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන් ජාත්‍යන්තර වෙළදාමේදී යොදාගනු ලබන ගෙවීම් ක්‍රමයක් **නොවන්නේ** කුමක් ද?

(1) ණයවර ලිපිය.

(2) මුදල් ඇණවුම.

(3) අයකර ගැනීමේ එකඟතාවය (Collection Agreement).

(4) අත්තිකාරම් ගෙවීම් (Payment in Advance).

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.8 ශ්‍රී ලංකාවේ තිබෙන නියාමන ආයතන (regulatory institutions) දෙකක්(02) සඳහන් කරන්න.

1.9 ගිවිසුම් වලට එළඹීම සඳහා සම්පූර්ණ හැකියාවක් (full contractual capacity) නොමැති වීම නිසා නීතියෙන් ආරක්ෂා කරනු ලබන පුද්ගලයන් වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

1.10 ගිවිසුමක් අවසාන කිරීමේ (terminating a contract) ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

# B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 02 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC සමාගම,** එහි බාහිර උපදේශකවරුන්ගෙන් කෙනෙකු වන **අනිල්** හට, එහි ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාමරය නිල වශයෙන් භාවිත කිරීමට ඉඩ දී තිබේ. ලිපිද්‍රව්‍ය සපයන්නෙකු වන **කමල්, අනිල්** ප්‍රධාන විධායක නිලධාරියා බවට අවංක ලෙස විශ්වාස කරමින් **සීමාසහිත ABC සමාගමට** ලිපිද්‍රව්‍ය සැපයීම සඳහා ගිවිසුමකට එළඹිණි. **කමල්** සැපයුම් වලට අදාල ගෙවීම් ඉල්ලා සිටි විට, **අනිල් සීමාසහිත ABC සමාගමේ** බාහිර උපදේශකවරයෙකු මිස සේවකයෙකු නොවන බැවින් ගෙවීම පියවා දැමීම **සීමාසහිත ABC සමාගම** ප්‍රතික්ෂේප කරන ලදී.

**සීමාසහිත ABC සමාගමෙන්** ගෙවීම් ඉල්ලා සිටීමට **කමල්** හට හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

" නැව තෙක් නොමිලේ [Free On Board (FOB)] සහ මිල, රක්ෂණය සහ ගැල් කුලිය [Cost, Insurance and Freight (CIF)] යනුවෙන් නම් වූ ප්‍රධාන ගිවිසුම් වර්ග දෙකක් ජාත්‍යන්තර වෙළඳාමෙහි තිබෙන අතර එම ගිවිසුම් එකිනෙ'කින් වෙන්කොට හඳුනාගත හැකි පරිදි එකිනෙකට ආවේණික ලක්ෂණ ද පවතී."

නැව තෙක් නොමිලේ (FOB) ගිවිසුම් සහ මිල, රක්ෂණය සහ ගැල් කුලී (CIF) ගිවිසුම් අතර ඇති වෙනස්කම් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

"චෙක්පතක් සහ විනිමය බිල්පතක් (bill of exchange) අතර ඇති ප්‍රධාන වෙනස්කම් වලින් එකක් වනුයේ චෙක්පතක් රේඛනය කළ හැකි වීමත් විනිමය බිල්පතක් රේඛනය කළ නොහැකි වීමත් ය. රේඛනය කිරීමෙන් චෙක්පතකට වැඩි ආරක්ෂාවක් ලබාදේ."

රේඛන වර්ග දෙකක්(02) ඒවායෙහි නෛතික බලපෑම ද (legal effects) සහිතව **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

දෙදරු පියෙකු වන **අමල්,** සහකාර කළමනාකරුවෙකු වශයෙන් 2012 වර්ෂයේ සිට කොළඹ ප්‍රසිද්ධ සුපිරි වෙළෙඳසැලක වැඩ කරයි. එක් දිනෙක ඔහු ළමයින් දෙදෙනා සමඟ පාසැල නිමවීමෙන් පසු නිවසට යමින් සිටියදී හදිසි අනතුරකට භාජනය වී තදබල ලෙස තුවාල වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂයක කාලයක් ඇඳවිවේක ගැනීම (bed rest) අවශ්‍ය විය. එමනිසා, ඔහුගේ රැකියා වගකීම් නිසියාකාරව ඉටුකිරීමට ඔහුට නොහැකි විය. නොහැකියාව / අශක්තුතාව (incapacity) සහ දීර්ඝ අසනීප නිවාඩු හේතුකොටගෙන දැන්, මානව සම්පත් කළමනාකරු විසින් ඔහුගේ රැකියාව අවසාන (terminate) කිරීමට තීරණය කර ඇත.

(a) මෙය සේවකයන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව, "සේවා නියුක්තිය අවසාන කිරීමක්දැයි" **අමල්** ට **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) සේවකයන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැහැර කරනු ලබන (excluded) සේවකයන් වර්ග දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

ගණකාධිකාරීවරයෙකු ඕනෑම සංවිධානයක් තුල ප්‍රධාන කාරයභාරයක් ඉටු කරනු ලබන අතර, ප්‍රධාන තීරණ ගැනීම් සඳහා ද දායක වේ. වාර්තා කිරීමේ අරමුණින් සමාගමක මූල්‍ය වාර්තා සමාලෝචනය කරන විට, ගණකාධිකාරීවරයෙකු අපක්ෂපාතී විය යුතු අතර ආචාරධර්ම අවශ්‍යතා කෙරෙහි පක්ෂපාතී විය යුතුය. පුද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ සේවය කරන ගණකාධිකාරීවරයෙකුට ඔහු වැඩකරන කර්මාන්තය කවරක් වුවද ආචාරධර්ම ගැටළු (ethical issues) වලට මුහුණ පෑමට සිදුවනු ඇත. බාහිර බලපෑම් මගින් මූල්‍ය වාර්තා හිතාමතා වෙනස් කිරීම (manipulate) සඳහා වන අවස්ථා අඩුකරලීමට ඔහු නිරන්තරයෙන් සෝදිසියෙන් සිටිය යුතු වේ. එසේ නොමැති වුවහොත්, එමගින් ආචාරධර්මානුකූල සහ අපරාධමය යන දෙයාකාරයෙන්ම උල්ලංඝනයන් සිදුවීමට මඟපෑදීම සිදුවිය හැකිය.

ගණකාධිකාරීවරයෙකු විසින් මුහුණදෙනු ලබන ප්‍රධාන ආචාරධර්ම ගැටළු පහක්(05) **සඳහන් කරන්න**.

(ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

**තිස්සංක** සහ **කපිල** 2014 වර්ෂයේදී ලී බඩු මිලදී ගැනීමේ සහ විකිණීමේ ව්‍යාපාරයක් ලෙස "NK හවුල් ව්‍යාපාරය" නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළහ. ඔවුන් අතර හවුල් ව්‍යාපාර ගිවිසුමක් නොතිබුණි. එමනිසා, හවුල් ව්‍යාපාරය පවත්වා ගැනීම සම්බන්ධ කරුණු නිරාකරණය කරගැනීම සඳහා ඔවුහු 1890 හවුල් ව්‍යාපාර ආඥාපනත අනුගමනය කරන ලදී.

2016 ජනවාරි මාසයේදී **තිස්සංක,** "NK හවුල් ව්‍යාපාරය" නමින් ලීබඩු අයිතම කිහිපයක් ණයට මිලදීගෙන ලාභ ආන්තිකයක් තබාගෙන ඒවා විකුණන ලදී. කෙසේවෙතත්, ඉහත ගනුදෙනුවෙන් උපයාගත් ලාභය ඔහු **කපිල** සමග බෙදා නොගත්තේය. එහි ප්‍රතිවිපාකයක් වශයෙන් **තිස්සංක** සහ **කපිල** අතර ආරවුලක් ඇති විය. දැන් ඔවුහු හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට තීරණය කරන ලදී.

(a) ඉහත ගනුදෙනුවෙන් උපයාගත් ලාභය **කපිල** සමඟ බෙදා ගැනීම සඳහා **තිස්සංක** වගකීමට යටත් වන්නේ දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) අධිකරණයේ මැදිහත් වීමෙන් හවුල් ව්‍යාපාරයක් විසුරුවා හැරිය හැකි අවස්ථා හතරක්(04) **සඳහන් කරන්න**.

(ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

(a) අවිනිශ්චිත සිදුවීමක දී (an uncertain event) රක්ෂකයා විසින් රක්ෂිතයා හට යම් මුදලක් ගෙවනු ලබන්නාවූ ද, ඒ සඳහා රක්ෂිතයා විසින් රක්ෂකයාට යම් ප්‍රතිජ්ඨාවක් ගෙවීමට එකඟවන ආකාරයට රක්ෂකයා සහ රක්ෂිතයා අතර ඇතිවන ගිවිසුමක් ලෙස රක්ෂණ නීතිය නිර්වචනය කළ හැකිය. හානිපූර්ණ රක්ෂණය සහ අභඹු රක්ෂණය වශයෙන් මූලික රක්ෂණ වර්ග දෙකක් ඇත.

ඉහත සඳහන් මූලික රක්ෂණ වර්ග (basic categories) දෙක(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **සුනිල්** තම කාර්යාලයීය ගොඩනැගිල්ල ගින්නෙන් ආරක්ෂණය / ආවරණය කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් දෙකකින් එනම් **සීමාසහිත RR රක්ෂණ සමාගමෙන්** සහ **සීමාසහිත සීලෝ රක්ෂණ සමාගමෙන්** පිළිවෙලින් රු.500,000/- ක් සහ රු.750,000/- ක් බැගින් රක්ෂණ ඔප්පු දෙකක් ලබාගෙන තිබේ. විදුලිය කාන්දු වීම නිසා හටගත් ගින්නකින් රු.300,000/- ක අලාභයක් ගොඩනැගිල්ලට සිදුවිය. රක්ෂණ සමාගම් දෙකෙන්ම රු.300,000/- බැගින් ඉල්ලා සිටීමට තමාට හිමිකමක් ඇතැයි **සුනිල්** තර්ක කළේය.

රක්ෂණ සමාගම් දෙකෙන්ම රු.300,000/- බැගින් ඉල්ලා සිටීමට **සුනිල් ට** හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න.**

(ලකුණු 06)
(මුළු ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණ පනතේ (Money Laundering Act) අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය තහනම් කිරීම සහ මුදල් විශුද්ධිකරණයට එරෙහිව අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම ය. මුදල් විශුද්ධිකරණයේ නිර්වචනය තුළට ගැනෙන ක්‍රියාවක් සිදුකරන කිසියම් පුද්ගලයෙකු හෝ ඒ සඳහා ආධාර අනුබල දෙන්නෙකු සහ ඊට පොළඹවන පුද්ගලයන් වරද (offence) සිදුකළා සේ සලකනු ලැබේ. මුදල් විශුද්ධිකරණය හා සම්බන්ධ කිසිදු ක්‍රියාවක් සිදුකරනු ලබන ඕනෑම නේවාසික ශ්‍රී ලාංකිකයෙකුට ද ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ඕනෑම ආයතනයකට ද (ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත) ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන ඕනෑම ක්‍රියාවකට ද මුදල් විශුද්ධිකරණ පනත අදාල වේ.

(a) "මුදල් විශුද්ධිකරණය" යන්නෙහි අර්ථය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(b) 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණ පනතට අනුව නීතිවිරෝධී ක්‍රියාකාරකම් (unlawful activities) පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

(a) සම්මුඛ පරීක්ෂණයකින් පසු බසයක් තුළ ගමන්කරද්දී **රසිත්ගේ** උපාධි සහතිකයේ මුල් පිටපත, AAT සාමාජිකත්ව සහතිකය, උප්පැන්න සහතිකය සහ තවත් වැදගත් සහතික බහා තිබූ සහතික ෆෝල්ඩරය (certificates folder) නැති විය. එම සහතික ඔහුට බෙහෙවින් වැදගත් නිසා, සහතික සහිත ෆෝල්ඩරය ඔහුට ආපසු ලබාදෙන ඕනෑම කෙනෙකුට රු.20,000/- ක ත්‍යාගයක් (reward) ලබා දෙන බවට ඔහු සති අන්ත පුවත්පතක දැන්වීමක් (advertisement) පළ කරන ලදී. දැන්වීම පිළිබඳ දැනුවත්භාවයක් නොතිබූ **තිශාදි,** සහතික බහාලූ ෆෝලඩරය, සොයාගත් අතර එහි ආවරණයේ පිටුපස සඳහන් ව තිබූ **රසිත්ගේ** තැපැල් ලිපිනයට එය ආපසු යවන ලදී. සහතික ෆෝල්ඩරය ආපසු යැවීමෙන් පසු ත්‍යාගය පිළිබඳව ඇය දැනගත් අතර, **රසිත්ගෙන්** එය ඉල්ලා සිටියාය. එහෙත් **රසිත්** ත්‍යාගය **තිශාදි** ට දීම ප්‍රතික්ෂේප කළේය.

**රසිත්** ගෙන් ත්‍යාගය ඉල්ලා සිටීමට **තිශාදි** ට නීතිමය හිමිකමක් තිබේදැයි **විමසන්න.** (ලකුණු 12)

(b) පරිගණක සහ පරිගණක උපාංග විකුණුම්කරුවෙකු වන **සමන්** පාවිච්චි කරන ලද පරිගණකයක්, රු.60,000/- කට, **ලෙස්ලි** ගෙන් සම්පූර්ණ ගණන මුදලින් ගෙවා මිලදී ගත්තේය. පරිගණකය **ලෙස්ලි** ගෙන් ලබා ගැනීමෙන් පසු **සමන්** එහි සුළු අළුත්වැඩියාවන් කිහිපයක් සිදුකර ඔහුගේ ප්‍රදර්ශනාගාරයේ එය ප්‍රදර්ශනය කරන ලදී. **සමන්ගේ** ගනුදෙනුකරුවෙකු වන **ජයලාල්,** පරිගණක උපාංගයක් සොයමින් සිටින අතර එම පරිගණකය දුටු අතර, එය මිලදී ගැනීමට ඔහුට අවශ්‍ය විය. ඊට පසු, **සමන්** රු.80,000/- කට එය **ජයලාල්** ට විකුණන ලදී. මාස තුනකට පසු එය **ලෙස්ලි** විසින් සොරකම් කරනු ලැබූ එකක් බව අනාවරණය වීම නිසා පොලිසිය විසින් එය ආපසු ලබාගන්නා ලදී. පොලිසියේ මැදිහත් වීමෙන්, පරිගණකය එහි මුල් අයිතිකරු වෙත ආපසු ලබාදෙන ලදී. **සමන්, ජයලාල්** ට රු.80,000/- ක් ආපසු ලබා දුන් අතර, **ලෙස්ලි** ට ගෙවන ලද රු.60,000/- අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නඩුවක් පවරන ලදී.

**ලෙස්ලි** ගෙන් රු.60,000/- නැවත අයකර ගැනීමට **සමන් ට** හිමිකමක් තිබේදැයි **විමසන්න**. (ලකුණු 13)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | හඳුනා දක්වන්න | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | සඳහන් කරන්න | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම. |
| | විමසන්න | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | පැහැදිලි කරන්න | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | අර්ථකතනය කරන්න | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | හඳුනාගන්න | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | සටහන් කරන්න | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | සාරාංශගත කරන්න | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | ප්‍රදර්ශනය කරන්න | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | පිළියෙල කරන්න | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | ප්‍රමුඛතා දක්වන්න | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | සසඳන්න | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | සමානකම් බලන්න | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |